ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන 2022/2023
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023
SNU6221/ESU4121- ප්‍රාථමික අධ්‍යාපනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.12.02 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "සැමට අධ්‍යාපනය" යන පදය පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන ජයග්‍රහණ තුන (03) ලැයිස්තුගත කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

03. 1997 හඳුන්වා දෙන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද තුන (03) නම් කර එය දැක්වෙන රූප සටහන ඇඳ ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

04. "සහභාගිත්වය සඳහා අයිතිය" කෙටියෙන් විස්තර කරන්න.

05. විෂයමාලා කළමනාකරණයේ දී ප්‍රාථමික පාසල් ගුරුවරයා විසින් සලකා බැලිය යුතු ප්‍රධාන සාධක සඳහන් කරන්න.

06. 3 ශ්‍රේණියේ සිසුවෙකු විසින් ගණිත විෂයේ දී කරන ලද එකතු කිරීමේ දෝෂ පහත දැක්වේ. ඔහු/ඇය විසින් කරන ලද වැරදි නිරීක්ෂණය කර එම ශිෂ්‍යයාගේ වැරදි නිවැරදි කිරීමට ඔබ උදව් කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 37 | 96 | 54 | 81 | 40 |
| -18 | - 29 | -36 | -17 | -13 |
| 21 | 73 | 22 | 76 | 33 |

07. 'විධිමත්' සහ 'අවිධිමත්' තක්සේරු කිරීම පද නිර්වචනය කරන්න.

08. ගුරු උපදේශක භූමිකාවේ ක්‍රියාකාරිත්වයන් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (අ) "නිපුණතා" යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ආ) 1997 දී ශ්‍රී ලංකාවේ පාසල්වලට හඳුන්වා දෙන ලද ප්‍රාථමික අධ්‍යාපනයෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 15)

10. (අ) දරුවන් ඉගෙනීමට අනුගමනය කරන වැදගත් ශිල්පීය ක්‍රම දහයක් **(10)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(ආ) ඉහත සඳහන් කර ඇති ඉගෙනීම සඳහා ළමයින් අනුගමනය කරන ඕනෑම ශිල්පීය ක්‍රම හතක් **(07)** තෝරාගෙන ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 14)

11. (අ) පහත සඳහන් පද අදාළ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)
    (a) තක්සේරු කිරීම
    (b) ඇගයීම

(ආ) ප්‍රාථමික පන්ති කාමරයේ දී තක්සේරු කිරීම හා ඇගයීම වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 06)

(ඇ) කාර්ය සාධනය මගින් තක්සේරු කිරීම පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (අ) ප්‍රාථමික අධ්‍යාපනයේ දාර්ශනික පදනම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) සමානාත්වය හා සාධාරණත්වය පවත්වා ගැනීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 14)

13. (අ) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික මට්ටමේ ප්‍රධාන ජයග්‍රහණ (Achievements) තුනක් **(03)** ලැයිස්තු ගත කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ) 1972 සිට 1997 දක්වා කාලය තුළ ප්‍රාථමික පාසලේ විෂය මාලාවේ සිදු වූ වෙනස්කම් සමාලෝචනය කරන්න. (ලකුණු 12)

14. (අ) ප්‍රාථමික පාසලේ සහායක පුද්ගලයින් පස් දෙනෙකු ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ආ) ඉහත සඳහන් කළ සහායක පුද්ගලයින්ගේ කාර්යභාරය සහ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.